# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 67— 1973 ජූලි 06 වැනි සිකුරාදා — 1973.07.06

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය – පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... | 833 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... | 846 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... | — |
| බදු මාභිරාදිය විකිණීම ... | 841 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් | — |
| තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම... | — | විවිධ දැන්වීම | — |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවාව—කොළඹ කොට්ඨාශය**

කොළඹ කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1973.07.16 වන දින පෙරවරු 11 දක්වා කොනිස්ටන් පෙදෙස, කොළඹ 7, බටහිර දිසාවේ වැඩ අධ්‍යක්‍ෂතුමා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. වැඩයේ නම—කැළණියේ උතුරු බැම්ම අළුත්වැඩියා කිරීම සඳහා එම උතුරු බැම්මේ 3 වෙනි සැතපුම දක්වා අනුමත කරන වර්ගයේ බොරළු කියුබ් 2,500 ක් සැපයීම.

ටෙන්ඩර් තැන්පත් මුදල: රු. 100.

3. 1973.07.13 වැනිදා දක්වා කාර්යාලීය වේලාවන් තුළදී ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7, කොළඹ කොට්ඨාශයේ විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි.

4. ටෙන්ඩර් ෆෝර්ම සඳහා අයදුම් කරන යෝජිත ටෙන්ඩර් කරුවන්, ඔවුන් විසින් වෙනත් දෙපාර්තමේන්තුවල මෙවැනි වැඩ කර ඇති නම් ඒ ගැන විස්තර හා ඔවුන්ගේ මුදලින් ඇති වටිනාකම දක්වා ප්‍රකාශනයක් සැපයිය යුතුයි. සේවාව සතුටුදායක ලෙස කරගෙන යෑම සඳහා ඔවුන්ගේ හැකියාව හෝ මුදල් හා වෙනත් අවශ්‍ය දේ ගැන අමතර විස්තර අවශ්‍ය වුවහොත් දැන්වූ ඕනෑම විටෙක සැපයිමට සූදානම්ව සිටිය යුතුයි.

5. ෆෝර්ම නිකුත් කිරීමට පෙර ඉහතින් සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල විධායක ඉංජිනේරු කාර්යාලයට භාර දී හෝ ඒ වෙනුවෙන් තැන්පත් මුදල් ගෙවා ඇති බවට කච්චේරියෙන් ලබා ගත් කුවිතාන්සියක් හෝ 1973.07.13 වෙනි දිනට හෝ ඊට පෙර කාර්යාල වෙලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

6. මෙම වැඩය ගැන සියළුම විස්තර සැලසුම් ආදිය කාර්යාලීය ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැක.

ඩී. පීරිස්,
වැඩ අධ්‍යක්‍ෂ, බටහිර දිසාව.

බටහිර දිසා වැඩ අධ්‍යක්‍ෂ කාර්යාලය,
තැ. පෙ. 1514,
කොනිස්ටන් පෙදෙස, කොළඹ 7.

7–77—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ)** වැනි ඡේදයන්හි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට **පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු** නොලැබේ.

**එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

මාතලේ බලවේග පේෂකර්ම වැඩපල අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.07.26 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 6,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 50 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973.07.25 දින පෙ.ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර්පත් ලබාගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1 (1/55)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973.06.22.

7-79—73. 07. 06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## දිසාපති කාර්යාලය, කුරුණෑගල

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති විසින් 1973.07.23 දින පෙ. ව. 11.30 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ:—

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි වියයුතු මුදල |
|---|---|
| පොල්ගහවෙල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ ගින්නෝරිකන්ද ගම් පුළුල් කිරීමේ ව්‍යපාර පාර තැනීම. | රු. 25,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට මහා මාර්ග, වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට සහ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ටද 1973.07.20 වැනි දින පස්වරු 2 දක්වා කුරුණෑගල කච්චේරියේ ඉඩම් ශාඛාවේ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. කොන්ත්‍රාත්තුව බලාපොරොත්තු වන අය තමන් එසේ ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි කුරුණෑගල දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3. වැඩය වෙනුවෙන් රු. 25 මුදලින් කුරුණෑගල දිසාපති කාර්යාලයේ තැන්පත් කර කුවිතාන්සිය සමග ලියාපදිංචිය සනාථ කරන ලියකියවිලි සමග මෙම කාර්යාලයට ඉදිරිපත් කර ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ලියාපදිංචි සමිති ටෙන්ඩර් තැන්පත් වලින් නිදහස් ය.

4. ටෙන්ඩර් පත් කුරුණෑගල දිසාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ හැකිය. ටෙන්ඩර් ආවරණය කරන කවරය මුද්‍රා තැබිය යුතු අතර එහි වම්පස උඩ කෙළවරේ වැඩයේ නම සඳහන් කළ යුතුය. ටෙන්ඩරය ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවනු ලැබේ නම්, ටෙන්ඩර භාර ගැනීමේ අවසාන දිනයේ දවල් 11.30 ට පෙර දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිය.

5. 1973.07.23 වන දින සවස 1.30 ට දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කාර්යාල වේලාවේදී කුරුණෑගල දිසාපතිගෙන් ලබාගත හැකිය.

එස්. එම්. එස්. බී. තියංගොඩ,
කුරුණෑගල දිසාපති වෙනුවට.

ඉඩම් අංශය,
දිසාපති කාර්යාලය,
කුරුණෑගල, 1973.07.06 වන දින.

7-33—73. 07. 06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තු ගොඩනැගිලි තැනීම

පහතින් දැක්වෙන ගොඩනැගිලි තැනීම සඳහා කොළඹ 2, කිව් පාරේ වනසංරක්ෂක, තැ. පෙ. 509 විසින් 1973 ජූලි මස 27 දින උදේ 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ:—

1. පැලෑටි වවන ගෙය—කොළඹ 2, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය.
2. පැලෑටි වවන ගෙය—එරබැද්ද, උඩරට දිසාව.
3. පැලෑටි වවන ගෙය—කොට්ටව, දකුණු දිසාව.

2. කොළඹ 2, කිව් පාරේ වන සංරක්ෂණ කාර්යාලයේ අංක 11 දරණ කාමරයේ ජ්‍යෙෂ්ඨ සහකාර වනසංරක්ෂක, ඇල්. සී. ඒ. ද ඇස්. විජේසිංහ මහතාගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුවේ. එම ටෙන්ඩර් කොළඹ වන සංරක්ෂණ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. එසේ නැත්නම් නියමිත දින හෝ ඊට පෙර ලැබෙන පිණිස කොළඹ 2, කිව් පාරේ වනසංරක්ෂක වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම ටෙන්ඩර් ආකෘති පත්‍රයක් සඳහාම කොළඹ, යෝක් විදියේ ලංකා බැංකු ශාඛාවේ අංක 34 ගිණුමේ වනසංරක්ෂක නමට රුපියල් 100 ක් තැන්පත් කොට, ටෙන්ඩර් ආකෘති පත් ලබා ගැනීම සඳහා එම රිසිට් පත ඉදිරිපත් කළ යුතුවේ. එක් විෂයයක් සඳහා එක් ටෙන්ඩරය බැගින් ඉදිරිපත් කළ යුතුවේ. 1973 ජූලි 26 වනදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘතිපත් ලබාගත හැක.

3. වැඩිමනත් විස්තර, සැලසුම් හා ප්‍රමාණ පත්‍රිකා, රාජකාරි වේලාවන්හිදී කොළඹ 2, කිව් පාරේ වනසංරක්ෂකගේ කාර්යාලයෙන් හෝ නුවරඑළිය සහ ගාල්ලේ දිසාවන නිලධාරි කාර්යාලවලින් ලබා ගත හැක.

ඇල්. සී. ඒ. ද ඇස්. විජේසිංහ,
වනසංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කාර්යාලය,
තැ. පෙ. අංක 509,
කිව් පාර, කොළඹ 2.

7-88—73. 07. 06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත භාරයේ පවත්නා හඟුරන්කෙත නානායම වැඩි දියුණු කිරීම

පහත විස්තර දක්වා ඇති සේවාවන් සඳහා 1973 ජූලි 20 දින පෙරවරු 10 දක්වා පිළිගත් ග්‍රාමසංවර්ධන සමිතිවලින් සමූපකාර සමිතිවලින්, කම්කරු සමිතිවලින් හා වාරිමාර්ග, දුම්රිය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ලියා පදිංචි වී ඇති (රු. 15.000 සිට ඉහළට) ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ. 1978 ජූලි මස 20 දින පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

| සේවාව | ප්‍රා. ආ. නි., කොට්ඨාශය |
|---|---|
| 1. නුවරඑළිය නගර සභා කොට්ඨාශය තුළ ඇති රජයේ නිවාස සහ රජයේ කායසිාල සඳහා ජල මුද්‍රිත වැසිකිලි නවයක් තැනීම | නුවරඑළිය. |
| 2. හඟුරන්කෙත නානායම වැඩි දියුණු කිරීම | උඩහේවාහැට. |

2. මෙම කායසිාලයෙන් ලබා ගන්නා ටෙන්ඩර් පත්‍ර වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් කෙළවරෙහි 'හඟුරන්කෙත නානායම වැඩි දියුණු කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර' යනුවෙන් සඳහන් කළ යුතු අතර ටෙන්ඩර් පත්‍ර සහිත කවරය මුද්‍රා තැබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර, දිසාපති, නුවරඑළිය යන ලිපිනයට අනුපිටපතකින් ද යුතුව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය.

3. ලේඛනගත තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර මෙම කායසිාලයේ කායසිාල සහකාරට හෝ අතිරේක කාර්යාල සහකාරට හෝ පෞද්ගලිකවම භාර දිය යුතුය.

4. 1973 ජූලි මස 19 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. නිකුත් කරනු ලබන සෑම ටෙන්ඩර්යක් වෙනුවෙන්ම රු. 25 ක් 'නුවරඑළියේ දිසාපති' නමින් තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මෙසේ ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම ශ්‍රී ලංකාවේ ඕනෑම දිසාපති කායසිාලයක කළ හැකිය. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවා එසේ ඔහුගේ ටෙන්ඩරය තෝරාගත් බව දන්වා සති දෙකක් ඇතුළත ටෙන්ඩරයේ වටිනාකමින්

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, 200 කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩය සඳහා 1973 ජූලි මස 25 වෙනි දින පෙ. ව. 10 වන තෙක් සීල් තබා ඉදිරි පත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| වැඩ විස්තරය | කොන්ත්‍රාත් කරුගේ අවම ලියාපදිංචි සීමාව රු. |
|---|---|
| 1. හාරගම ඩිපෝ භූමිය පස් කපා සමතලා කිරීම—ඉසි/546 ... | 25,000 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල, පිළියෙල කොට අනුපිටපතකින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියළුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් ආදිය ඔහුගේ කායාලයේ දී පරීක්ෂා කළ හැක. ලංගම, රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක් ද ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත 1973 ජූලි මස 24 වෙනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා එම කුවිතාන්සි මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද, ටෙන්ඩර් කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍ර. ගි. නි. තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
කොළඹ 5.

7-101—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## පාවිච්චියට ගත නොහැකි උපකරණ විකිණීම

මෙහි පහත සඳහන් පාවිච්චියට ගත නොහැකි උපකරණ මිලයට ගෙන ඉවත් කරගෙන යැම සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

එක (1) පාවිච්චියට ගත නොහැකි ගණන් එකතු කිරීමේ යන්ත්‍රය දෙක (2) ඉංග්‍රීසි යතුරු ලියනය.

1973. 08. 08 වැනි දිනට හෝ ඊට පෙර පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුවූ ටෙන්ඩර් පත්‍ර ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලැබිය යුතුය.

ටෙන්ඩර් පත් බහාලන ලද කවරයේ වම්පස උඩ කෙළවරේ "පාවිච්චියට ගත නොහැකි උපකරණ මිළයට ගෙන ඉවත් කරගෙන යැම සඳහාවූ ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් ටෙන්ඩරයෙහි ලකුණු කොට බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරිතැන වෙත ලියාපදිංචි තැපැලෙන් ලැබීමට හෝ බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියෙහි දැමීමට හෝ සැලැස්විය හැක.

සියළුම ටෙන්ඩර් පත්‍ර 1973 අගෝස්තු මස 08 වැනි දින පෙරවරු 10ට විවෘත කරනු ලැබේ. සියළුම ටෙන්ඩර්කරුවන්ට තමන්ට කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ඒ ස්ථානයේ පෙනී සිටිය හැක.

තෝරගනු ලැබූ ටෙන්ඩර්කරු සඳහන් කර තිබෙන මිළ ගණන් සම්පූර්ණයෙන්ම තැන්පත් කිරීමට කටයුතු යොදවා ගත යුතු අතර ටෙන්ඩරය භාරගත් බවට ලිඛිත දැන්වීමක් ලැබී දින 14 ක් ඇතුලත ඒ බඩු භාණ්ඩාදිය ඉවත් කර ගෙන යා යුතුය.

ප්‍රශ්නයක් නොමැතිව කිසියම් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලයත්, ටෙන්ඩරයක එක්තරා කොටසක් භාරගැනීමේ බලයලත් රජය තමන් අතම රඳවාගෙන ඇති බව මෙයින් දත යුතුය.

වෛද්‍ය ඩී. බ. තියන්ගොඩ,
බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය,
1973 ජූනි මස 20 වැනි දින.

7-80—7.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මඩකලපුව කොට්ඨාශය

### පාවිච්චි කරන ලද එක්ස්රේ පටල විකිණීම

මඩකලපුව මහ රෝහලේ ඇති පාවිච්චි කරන ලද එක්ස්රේ පටල රාත්තල් 1,180ක් විකිණීම සඳහා මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරී විසින් 1973 ජූලි මස 16 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා දිවයිනේ ඕනෑම කච්චේරියක රු. 25ක් තැන්පත් කළ බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ටෙන්ඩර්පත්‍රයට ඇමිණිය යුතුය. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම සඳහා මුද්‍රිත ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. ටෙන්ඩර්කරු විසින් ඔවුන්ගේ ටෙන්ඩර්පත්‍ර පිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව මුද්‍රාව තබන ලද කවරයක බහා එවිය යුතුය. එම කවරයේ වම් පස උඩ කෙළවරේ "පාවිච්චි කරන ලද එක්ස්රේ පටල සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර ඉහත අංක 1 ඡේදයේ සඳහන් දිනයට හා වේලාවට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එසේ නැතිනම් මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. එසේත් නැතිනම් සෞඛ්‍ය සේවා අධිකාරී හෝ මෙම කාර්යාලයේ ලේකම්/ගණකාධිකාරීට භාර දිය යුතුය.

4. කිසිම ප්‍රශ්නයක් නොමැතිව ටෙන්ඩර් සමහරක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ සහ ඉන් එකක් භාර ගැනීමේ අයිතිය රජය සතුය. මෙම දැන්වීමේ සඳහන් සෑම කොන්දේසියක්ම නොපිළිපැද තිබුණ හොත් එවැනි ටෙන්ඩර් සලකා බලනු නොලැබේ.

5. මඩකපුව මහ රෝහලේ වෛද්‍ය අධිකාරි විමසීමෙන් පසු මෙම භාණ්ඩ කාර්යාල වේලාවන් තුළදී පරීක්ෂා කළ හැක. ටෙන්ඩර්කරු විසින් යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් කර තිබේනම් එයට ඔවුන්ගේ අත්සන තැබිය යුතුය. ටෙන්ඩර්කරුවන් විසින් මුළු තොග වෙනුවෙන් මිළක් සඳහන් කළ යුතුය.

6. තේරුනු ටෙන්ඩර්කරු පිළිගත් බව දන්වා දින තුනක් ඇතුළත දී ඉදිරිපත් කරන ලද මිළ ගණන් සම්පූර්ණයෙන්ම මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරි වෙත යැවිය යුතුය. මුදල් ගෙවා දින තුනක් ඇතුළත මඩකලපුව රෝහල් භූමියෙන් ඉවත් කර ගත යුතුය.

7. ඉහත සඳහන් 6 වන ඡේදයේ කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කරනු ලැබේ. තවත් අවශ්‍ය විස්තර මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරිගෙන් ලබා ගත හැක.

වී. සිංගනායගම්,
මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 ජූනි මස 02 වන දින,
මඩකලපුව සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදීය.

7-41—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1973 ජූලි මස 27 වැනි දින පස්වරු 2 දක්වා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(i) හොඳින් පුළුස්සන ලද මධ්‍යම ප්‍රමාණයේ හොඳ වර්ගයේ ගඩොල් 1,000 බැගින්.

(ii) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ ගංගා වැලි කියුබ් එක බැගින්.

(iii) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ $\frac{3}{4}$" සහ $1\frac{1}{2}$" කැට ගල් කියුබ් 1 බැගින්.

(iv) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ තම්බන ලද හුණු බුසල බැගින්.

(v) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ අළුහුණු බුසල බැගින්.

මෙම ද්‍රව්‍යයන් පහත සඳහන් ස්ථාන වලට ගෙනවිත් භාරදිය යුතු සහ රජයේ වාහන වලට පටවා දියයුතු මිල ගණන් වෙන වෙනම සඳහන් කර එවිය යුතුය.

(i) ඉබ්බාගමුව ගොඩනැගිලි වැඩබිම.
(ii) හසලක ගොඩනැගිලි වැඩබිම.
(iii) මීගමුව ගොඩනැගිලි වැඩබිම.
(iv) වැලිමඩ ගොඩනැගිලි වැඩබිම.
(v) රිකිල්ලගස්කඩ ගොඩනැගිලි වැඩබිම.

2. මෙම සියළුම ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරන ලද නියම තත්වයේ ඒවා විය යුතුය.

3. මෙම එක් ගොඩනැගිලි ද්‍රව්‍යයකට හෝ කොටසකට හෝ සියල්ලටම හෝ ටෙන්ඩර් කළ හැකිය.

4. එක් එක් ගොඩනැගිලි වැඩ බිම සඳහා වෙන වෙනම ටෙන්ඩර් ආකෘති පත් පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන්" යන්න සඳහන් කොට සියළුම ටෙන්ඩර් අත්සන් තබා සීල්කර සුරක්ෂිතව7 ලේඛනගත තැපෑලෙන් 1973 ජූලි මස 27 වැනි දින පස්වරු 2 ට පෙර "සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, සිවිල් ඉංජිනේරු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පේරාදෙනිය." යන ලිපිනයට එවිය යුතුය.

5. සියලුම ටෙන්ඩර් පත් අනුමත කරණ ලද දිනයේ සිට දින 40ක කාලයක් තුළ භාරගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ කොටසක් හෝ එකක් හෝ භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම ඉංජිනේරු (ගොඩනැගිලි) තැනගෙන් අසා දැනගත හැකිය.

එල්. එස්. එස්. ජයසුන්දර,
අධිකාරී ඉංජිනේරු (ගොඩනැගිලි).

1973 ජූලි මස 22 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු අංශයේදී ය.

–8—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

### හිඟුරාණ සීනි කර්මාන්තායතනය සඳහා යන්ත්‍ර සහ උපකරණ සැපයීම

ඉහත සඳහන් සීනි කර්මාන්තායතනය වෙත යන්ත්‍ර සහ උපකරණ සැපයීම සඳහා ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය විසින් ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ. ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ සම්පත් අරමුදල මගින් යන්ත්‍ර සහ උපකරණ මිළදී ගැනීම සඳහා මුදල් සපයනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි, විශේෂ විස්තර සහ අනිකුත් කරුණු 1973 ජූනි මස 25 වැනි දින සිට 1973 අගෝස්තු මස 24 වැනි දින දක්වා කොළඹ 5, ඇල්විටිගල මාවතේ නොම්මර 651 දරණ ස්ථානයේ පිහිටි පහත සඳහන් අයගේ කායසීලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි කට්ටලයක් සඳහා ටෙන්ඩර්කරුවන් මුදලින් රු. 50 ක ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් තැබිය යුතු අතර, එක් එක් අතිරේක සහ අවලංගු කරන ලද ටෙන්ඩර් ලියකියවිලි සඳහා ආපසු නොගෙවනු ලබන රු. 25 ක මුදලක් ද ගෙවිය යුතුය.

සභාපති,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය.

1973 ජූනි මස 19 වැනි දින,
ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය,
651, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 5.

7–93—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### කළුතර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

පහත සඳහන් වැඩ සඳහා රු. 15,000 දක්වා වැඩ වලට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන්, ග්‍රාම සංවර්ධන හා සමුපකාර සමිතිවලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) පැනියාවල තරුණ ජනපදයේ නෙත්තිකානු තැනීම.
(2) පැනියාවල තරුණ ජනපදයේ ජනපද නිලධාරී නිවාස අලුත් වැඩියාව.
(3) පැනියාවල තරුණ ජනපදයේ ඇතුළත පාරේ බෝක්කු තැනීම.
(4) පැනියාවල තරුණ ජනපදයේ ඇතුළත පාර අළුත්වැඩියාව.
(5) කෙළින්කන්ද තරුණ ජනපදයේ නෙත්තිකානු තැනීම.
(6) කෙළින්කන්ද තරුණ ජනපදයේ ඇතුලත පාරේ බෝක්කුවල කොන්ක්‍රීට් තට්ටු දැමීම.
(7) හැඩිගල්ල ජනපදයේ බෙහෙත් ශාලා, ගොඩනැගිල්ල අළුත් වැඩියාව.

2. එක් එක් වැඩය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර දිසාපති කායසීලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ හෝ නියමිත දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් කළුතර දිසාපතිට ලැබෙන සේ එවිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරේ වැඩයේ නම් ලියා 73. 07. 23 වැනි දින පස්වරු 1.00 ට පෙර ලැබෙන සේ තැපැලෙන් එවිය යුතුය. නැතිනම් ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. ටෙන්ඩර් පත්‍ර 73. 07. 23 වැනි දින පස්වරු 1.30 ට විවෘත කරනවා ඇත. එදින එම වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර 73.07.20 වැනි දින පස්වරු 2.00 දක්වා කළුතර දිසාපති කායසීලයෙන් ලබාගත හැකිය. නියමිත පෝරමයේ ඉදිරිපත් කරනු නොලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන් විසින් එවනු ලබන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලබන මැකීම්, කැපීගැම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයක්ම ඔහුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රු. 10 කළුතර දිසාපති කායසීලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

7. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින දහයක් ඇතුලත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල් රාජසන්තක කරනු ලැබේ.

8. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම් ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් හෝ ඒ දැන්වීම් ටෙන්ඩර්කරුට ලැබුනාක් මෙන් සළකනු ලැබේ. ගිවිසුම් පත් අත්සන් කිරීමෙන් පසුව අනික් සියළු තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

9. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරණ ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස කළුතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබීමෙන් නිදහස්ය.

10. ටෙන්ඩර් වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්න කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයකින් කොටසක් භාර ගැනීමේ අයිතිය මුළුමණින්ම රජය කෙරෙහි පවතින්නේය.

11. ටෙන්ඩර් මණ්ඩලයේ අවසර නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කරගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේය.

12. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයේ නම, ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

කළුතර දිසාපති

1973 ජූනි මස,
කළුතර දිසාපති කායසීලයේදීය.

7–20/1—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

### 6 (iii) ඡේදයට අදාල සටහන

(i) "අතිරේක ගාස්තු" යන්නෙන් සාමාන්‍ය වරාය ප්‍රමාදයන් අදහස් හෝ ඊට එවැනි ප්‍රමාදයන් ඇතුලත් නොවන අතර, එම ගාස්තු නැවට භාර නොගනු ලබන නැව් බඩු සම්බන්ධයෙන් නැව් ඒජන්තවරුන් විසින් දෙපාර්තමේන්තුවට ගෙවනු ලබන ගාස්තුවලට අදාල පැය ගණනට සීමා වේ.

(ii) චාප්පුවේ සිට ටෝබේ මධ්‍ය ගබඩාවට නැවත ප්‍රවාහනය කරන ලද නැව් බඩු වෙනුවෙන් අතිරේක ගාස්තු නො ගෙවනු ලබන අතර, එවැනි අවස්ථාවලදී නැවත ප්‍රවාහනය කිරීමේ ගාස්තු පමණක් ගෙවනු ලැබේ.

7. මෙම සේවාව වෙනුවෙන් ඉහත සඳහන් කරන ලද අතිරේක ගාස්තු හැරෙන්නට වෙනත් කිසිම ක්‍රමයක ප්‍රමාද ගාස්තුවක් කොන්ත්‍රාත්කරුට නො ගෙවනු ලැබේ.

8. ප්‍රවාහනය කරන කාලය තුළදී රථ තොගය නැතිවීමක් හෝ ඊට පැමිණෙන යම් හානියක් වෙනුවෙන් යම් වන්දියක් ඉල්ලීමක් වේ නම් එය සාර්ථකවන ටෙන්ඩර්කරුගේ වගකීම වන්නේ ය.

9. මෙම ප්‍රවාහන සේවාව කරගෙන යාම සඳහා සාර්ථක වන ටෙන්ඩර්කරු රුපියල් 5,000 බැංකු ඇපකරයක් ඉදිරිපත් කර දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට එළඹිය යුතුය.

10. කොන්ත්‍රාත්කරුගේ කිසියම් සේවකයෙකු විසින් හෝ වෙනුවෙන් වන්දි ඉල්ලා සිටීමේ ප්‍රශ්නයක් පැනනැගුනහොත්, 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 පරිච්ඡේදය) හා ඒ පිළිබඳ අනිකුත් නෛතික සංශෝධන හා නිවේදන යටතේ ඇති වගකීම්වලින් කොන්ත්‍රාත්කරු මෙම දෙපාර්තමේන්තුව නිදහස් කළ යුතුය.

11. මෙම සේවාව සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන කම්කරුවන් පමණක් යෙදවිය යුතුය. යම් කම්කරුවෙකු නොමනා පුද්ගලයෙකු බව වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්ට පෙනී ගියහොත් එම කම්කරුවා සේවයේ රඳවා ගැනීමට විරුද්ධ වීමට ඔහුට හැකිවන අතර, සාර්ථකවන ටෙන්ඩර්කරු එම කම්කරුවාගේ සේවය නතර කිරීමට වහාම කටයුතු කළ යුතුය.

12. කොන්ත්‍රාත්තුවට අදාල සම්පූර්ණ කාලය සඳහා ප්‍රවාහනය කිරීමට නියමිත නැව්බඩු ප්‍රමාණය වෙනුවෙන් සම්පූර්ණ රක්ෂණය සාර්ථකවන ටෙන්ඩර්කරු විසින් ලබා ගත යුතුය.

13. කොළඹ 1, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ, 5 වැනි මහලේ ඇති මගේ කාර්යාලයේදී 1973 අගෝස්තු 10 වැනි දින පෙරවරු 10ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී කැමති ටෙන්ඩර්කරුවනට ඒ සඳහා පෙනී සිටිය හැකිය.

14. වැඩිමනත් විස්තර කොළඹ 1, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ, 5 වැනි මහලේ ඇති වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඇම්. සී. සී. ප්‍රනාන්දු,
වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්.

වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 147,
5 වැනි මහල,
තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973 ජූනි මස 22 වැනි දින.

7–128—73.07.06. දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

### හිස් සිමෙන්ති මලු විකිණීම සහ ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් පත්

වාරිමාර්ග, විදුලිබල, මහා මාර්ග අමාත්‍යාංශයේ සබරගමුව දිසාවේ ප්‍රාදේශීය සේවා සිවිල් ඉංජිනේරු සංවිධානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්—

1. හිස් සිමෙන්ති මලු,

විකිණීම සහ ඉවත් කර ගැනීම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික ආයතන වලින් පහත සඳහන් විධායක ඉංජිනේරු කොට්ඨාශ සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් බාරගනු ලැබේ :—

(අ) ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ රත්නපුර දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාශ.

(ආ) ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාශ.

ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත රත්නපුර දිස්ත්‍රික්කය වෙනුවෙන්ද, නැතහොත් කෑගල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන්ද යන බව නියත වශයෙන් සඳහන් කළ යුතුය.

2. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වනුයේ 24.7.73 දින පෙ. ව. 10ට වේ. ඉහත සඳහන් එක් එක් දිස්ත්‍රික්කය වෙනුවෙන් රු. 50ක මුදලක් මෙම කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චේරියක තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු, 23. 7. 73 වන දින අ. භා. 2ක වන තෙක් ටෙන්ඩර් පත් ලබා ගත හැක.

3. ටෙන්ඩර් විවෘත කිරීම 24. 7. 73 දින පෙරවරු 11ට සබරගමුව දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේදී සිදු කරනු ඇත. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

4. කොන්ත්‍රාත්තුව 1973. 12. 31 දිනෙන් අවසන් වන කාලයක් සඳහා වේ. වැඩි විස්තර රත්නපුරයේ වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා ගත හැක.

එස්. සෙල්වදුරෙයි,
වැඩ අධ්‍යක්ෂ,
සබරගමුව දිසාව.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
සබරගමුව දිසාව,
රත්නපුර, 1973. 6. 25.

7–127—73.07.06. දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

### සුරාබදු දෙපාර්තමේන්තුව

### කළුතර අංක 2 සුරාබදු ගුදමේ ඇති පාවිච්චියට නොගන්නා හිස් බෝතල් විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

කළුතර, අංක 2, සුරාබදු ගුදමේ ඇති පාවිච්චියට නොගන්නා සුදු හිස් බෝතල් ගැලුම් 3,500 ක් සහ දුඹුරු හිස් බෝතල් ගැලුම් 500 ක්ද විකිණීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් පත්‍ර 1973 ජූලි මස 30 වැනි දින මධ්‍යාහ්න 12 දක්වා කොළඹ 1, ජේම්ස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් විසින් භාරගනු ලැබේ.

ගැනුම්කරුවන් විසින් බෝතල් ගැලුමකට ගෙවීමට අදහස් කරන මිල ප්‍රමාණය හා ගැනීමට අදහස් කරන බෝතල් ප්‍රමාණය ද සඳහන් කළ යුතුවේ. වැඩ කරන සාමාන්‍ය වේලාවන් ඇතුළත මෙම හිස් බෝතල්, කළුතර, අංක 2 සුරාබදු ගුදමේදී පරීක්ෂා කර බැලිය හැකිය.

ජේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

1973. 06. 25 වන දින,
කොළඹ දීය.

7–123—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ලිහිසි තෙල් ඇසිරීම පිණිස ඉම්පීරියල් ගැළුම් එකේ දිගටි හතරැස් ටින් සකස් කිරීම සඳහා පැතැලි ටින් තහඩු 4,50,000 සහ ඊට සම්බන්ධ අමතර කොටස් කට්ටල සැපයීම සඳහා ටෙන්ඩරය

1973.07.06 දින පූ. භා. 10 අවසන් වීමට තිබූ ඉහත සඳහන් ටෙන්ඩරය 1973.07.18 දින පූ. භා. 10 තෙක් දීර්ඝ කොට ඇත.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3, 1973.06.25.

–130—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා නාවික හමුදව

ශ්‍රී ලංකා නාවික හමුදවේ පහත සඳහන් කාර්යන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ඒ ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 වනතුරු, කොළඹ 1, තැ. පෙ. 593, ශ්‍රී ලංකා නාවික හමුදවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| කාර්යය | ටෙන්ඩර් භාරගනු ලබන අවසාන දිනය | අවශ්‍ය මූල්‍ය වත්කම රු. | ශ. |
|---|---|---|---|
| (අ) කොළඹ, 1 නාවික හමුද මූලස්ථාන යේ, වැඩසේවා ගොඩනැගිල්ලේ එකතු කිරීම් සහ වෙනස් කිරීම් සම්පූර්ණ කිරීම සඳහා ... | 1973 ජූලි 25 ... | 2,00,000 | 0 |
| (ආ) ත්‍රිකුණාමලයේ, ශ්‍රී. ලං. තිස්ස ආයතනයේ අංක 319 දරණ "ඊ" ගොඩනැගිල්ලේ එකතු කිරීම් සහ වෙනස් කිරීම් සඳහා (විවාහක නිවාස පහකට පරිවර්තනය කිරීම) | 1973 ජූලි 25 ... | 2,00,000 | 0 |
| (ඇ) ත්‍රිකුණාමලයේ, තටාකාංගණයේ ශ්‍රී. ලං. තිස්ස ආයතනයේ, ගබඩා ගොඩනැගිල්ලේ අළුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම් සම්පූර්ණ කිරීම සඳහා ... | 1973 ජූලි 25 ... | 50,000 | 0 |

2. කොළඹ 1, ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරීගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම මූලස්ථානයේ මුදල් හා සිවිල් පාලන අධ්‍යක්ෂ වෙත, සෑම කාර්යක් සඳහාම වෙන වෙනම රු. 100 බැගින් තැන්පත්කර ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන්, අංක 17 දරණ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරීගේ කාර්යාලයෙන් 1973 ජූලි මස 18 දින දහවල් 12 වනතුරු ටෙන්ඩර් පත් ලබාගත හැක. ටෙන්ඩර් ගාස්තු වශයෙන් ආපසු නොගෙවන ලබන රු. 5 ක මුදලක් ගෙවිය යුතුය. චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.

3. ඉහතින් සඳහන්කර ඇති මූල්‍ය වත්කම් ප්‍රමාණය සඳහා රජයේ කොන්ත්‍රාත්තු භාරගන්නා ලද බවට විධිමත් ලිඛිත සාධක ඉදිරිපත් කළ හැකි අයදුම් කරුවන් පමණක් ටෙන්ඩරය ඉල්ලීම සඳහා සුදුස්සෝ වෙත්.

4. ටෙන්ඩරය ලියාපදිංචි තැපැලෙන් එවිය හැකිවන අතර, නො එසේ නම් මූලස්ථානයේ අංක 14 දරණ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකිවේ. කවරයේ වම් උඩ කෙළවරේ "වැඩසේවා ගොඩනැගිල්ලේ එකතු කිරීම් සහ වෙනස් කිරීම් සම්පූර්ණ කිරීම්", "ත්‍රිකුණාමලයේ 'ඊ' ගොඩනැගිල්ලේ එකතුකිරීම් සහ වෙනස් කිරීම් සහ පරිවර්තනය කිරීම් සම්පූර්ණ කිරීම්", "ත්‍රිකුණාමලයේ ගබඩා ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම" යනුවෙන් වෙන වෙනම සඳහන් කරන්න. ඉහත පළමුවැනි ඡේදයේ සඳහන් පරිදි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ලැබෙන සේ මෙම ටෙන්ඩර් පත් එවිය යුතුය. මෙම දිනය හා වේලාව පසුවී ලැබෙන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

5. ටෙන්ඩරය විවෘත කිරීමෙන් පසු සති 8 ක කාලයක් සඳහා ටෙන්ඩර් කරුවන් විසින් තම ටෙන්ඩරය විවෘතව තැබිය යුතුය.

6. කුමන හෝ සියළුම ටෙන්ඩර් පත් ප්‍රශ්න කිරීමකින් තොරව නිශ්ප්‍රභා කිරීමේ අයිතියත්, ටෙන්ඩරයක කුමන හෝ කොටසක් භාරගැනීමේ අයිතියත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතුවේ. මෙම ටෙන්ඩරය සමග ප්‍රසිද්ධ කර ඇති උපදෙස් සහ ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරනු ලබන ටෙන්ඩර් පිළිබඳ පොදු රෙගුලාසි තරයේ පිළිපැදි නැති ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ.

7. කුමන හෝ සියළුම ටෙන්ඩර්කරුවකු ටෙන්ඩරයේ අවසාන දිනට පෙර, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත නොදන්වා, ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අසමත් වුවහොත් එම ටෙන්ඩර් තැන්පතු මුදල රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගත් ටෙන්ඩර්කරු විසින් යථෝක්ත කොන්ත්‍රාත්තුවේ සඳහන් කාර්යයන් සඳහා ලාංකික කම්කරුවන් පමණක් සේවයේ යෙදවිය යුතු අතර, හැකි සෑම අවස්ථාවකදීම එම කාර්යයන් කැරෙන ප්‍රදේශයෙන්ම සේවකයින් බඳවාගත යුතුය.

9. ඉහත සඳහන් දිනයේදී හා වේලාවේදී ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවනට හෝ ඔවුනගේ නියෝජිතයිනට හෝ පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ.

10. මෙම මූලස්ථානයේ අංක 17 දරණ කාමරයේදී සැලසුම් පරීක්ෂාකළ හැක. භූමිය සහ සැලැස්ම පරීක්ෂාකර බැලීම සඳහා කොළඹ, නාවික හමුද මූලස්ථානයේ, ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරි සමග විධිවිධාන සලසාගත හැක.

11. තවදුරටත් අවශ්‍ය විස්තර ලබාගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරිට අයැදුම් කළ යුතුය.

එච්. ජේ. එස්. බෝල්ඩසිං,
ලුතිනන් කොමාන්ඩර් (ඉ), ශ්‍රී.ලං.නා.හ.,
නාවික හමුදපති වෙනුවට.

1973 ජූනි මස 27 දින,
කොළඹ 1.
තැ. පෙ. 593,
දරණ ස්ථානයේ ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානයේදී.

7–152—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කළුතර නිර්මාණ කොට්ඨාශයේ (බෙන්තර ගඟ දකුණු ඉවුර ව්‍යාපාරයේ) පහත සඳහන් වැඩ සඳහා ඒ ඒ විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති ගණන් වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ගෙන්, පලාතේ සමුපකාර සමිතිවලින්, කම්කරු සමිතිවලින්, ග්‍රාම සංවර්ධන සමිතිවලින් සහ ගොවිකාරක සභාවලින් කළුතර, පලාතොට නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. 1973.07.23 දින සිට 1973.07.25 (දෙදිනම ඇතුළුව) දින දක්වා කළුතර, පලාතොට වාරිමාර්ග නිර්මාණ කොට්ඨාශයේ, නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාලීය වේලාවන්තුලදී ලබාගත හැකි ටෙන්ඩර් පත්වල ටෙන්ඩර් අයදුම්පත් සකස්කර පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතුද ? නැද්ද ? යන්න සලකා බැලීම සඳහා නිර්මාණ ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර එම විෂයයන් ඉදිරියෙන් සඳහන්ව ඇති ගණන්වලට අනුව ටෙන්ඩර් තැන්පත් මුදල් කළුතර, පලාතොට, වාරිමාර්ග නිර්මාණ කොට්ඨාශයේ නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්යාලයේ තැන්පත්කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය 1973.07.25 දින හෝ ඊට පෙර කාර්යාලීය වේලාවන් තුලදී එම කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් අයදුම්පත් සීල්තබා වැසූ කවරයක බහා එම කවරයේ වම්පස උඩකොනේ තමන් අයදුම් කරනලද ඒ ඒ වැඩයේ නම පැහැදිළිව සඳහන්කොට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් පුද්ගලිකව පැමිණ කළුතර, පලාතොට, නිර්මාණ ඉංජිනේරු තැනගේ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. 1973.07.27 දින පෙරවරු 11 ට ටෙන්ඩර් පෙට්ටිය විවෘත කරනු ලබන අතර කොන්ත්‍රාත්කරු හෝ ඔහුගේ නියෝජිතයන් ඒ වේලාවේදී පැමිණ සිටිය යුතුය. තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු විසින් තමන් එසේ තෝරාගෙන ඇති බව දන්වමින් ලිපිය ලැබී සතියකින් වැඩ පටන්ගෙන තෙමසකින් වැඩය නිමකළ යුතුය. කොන්ත්‍රාත්කරු විසින් නියමිත කාලය තුලදී වැඩ නිම කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත් කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුලත් කිරීමට අවකාශ ඇත.

### කළුතර නිර්මාණ කොට්ඨාශය

(බෙන්තර ගඟ දකුණු ඉවුර කරදිය වැලැක්වීමේ ව්‍යාපාරය)

| වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි වියයුතු ගණන රු. ශ. | ටෙන්ඩර් තැන්පතුව රු. ශ. |
|---|---|---|
| 1. ලද්දූව—වරාපිටිය කරදිය වැලැක්වීමේ වේල්ලේ සැ. 1, ද. 26 ස්ථානයේ විෂ්කම් භය අඩි3 ක්වූ හියුම් පයිප්ප පේළි දෙකක් යොද (ස්වයංක්‍රිය ඇරෙන වැහෙන දෙරක් සහිත) සොරොව්වක් තැනීම ... | 25,000 ... | 25 0 |
| 2. ලද්දූව—වරාපිටිය කරදිය වැලැක්වීමේ වේල්ලේ සැ. 2, ද. 15 ස්ථානයේ විෂ්කම් භය අඩි 3 ක්වූ හියුම් පයිප්ප පේළි දෙකක් යොද (ස්වයංක්‍රියව ඇරෙන වැහෙන දෙරක් සහිත) සොරොව්වක් තැනීම ... | 25,000 0 ... | 25 0 |
| 3. ලද්දූව—වරාපිවිය කරදිය වැළැක්වීමේ වේල්ලේ සැ. 2, ද. 48 ස්ථානයේ විෂ්කම් භය අඩි 3 ක්වූ හියුම් පයිප්ප පේළි දෙකක් යොද (ස්වයංක්‍රියව ඇරෙන වැහෙන දෙරක් සහිත) සොරොව්වක් තැනීම ... | 25,000 0 ... | 25 0 |
| 4. මීගම කරදිය වැලැක්වීමේ වේල්ලේ සැ. 0, ද. 51 ස්ථානයේ විෂ්කම්භය අඩි 3 ක්වූ හියුම් පයිප්ප පේළි දෙකක් යොද (ස්වයං ක්‍රියව ඇරෙන වැහෙන දෙරක් සහිත) සොරොව්වක් තැනීම ... ... | 25,000 0 ... | 25 0 |

එම්. යෝගරානන්දන්,
නිර්මාණ ඉංජිනේරු (වාරිමාර්ග) කළුතර.

වාරිමාර්ග නිර්මාණ කොට්ඨාශ කාර්යාලය,
පලාතොට, කළුතර, 1973.06.25.

7–144—73. 07. 06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : එල්.එම්. 1505.

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 73.08.03 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ.පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| | වැඩෙහි ස්වභාවය | ප්‍රා.ආ.නි. කොටස | ලියාපදිංචි විය යුතු මුදල රු. | ශ. |
|---|---|---|---|---|
| 1. | ඉහකැටිය ජනපද පාර ... | හේවාහැට ... | 50,000 | 0 |
| 2. | පල්ලේවත්ත සිට උල්පතගම දක්වා අලිකන්ද පාරට තාර දැමීම | හසලක ... | 50,000 | 0 |
| 3. | අඹතලාව ජලනල ව්‍යාපාරය ... | ගිනිගත්හේන ... | 30,000 | 0 |
| 4. | අලකොල හංදියේ සිට පඩරැල්දෙනිය ජනපද පාර | යටිනුවර ... | 25,000 | 0 |
| 5. | වැරැල්ලමාන ජනපද පාර ගල් අතුරා තාර දැමීම | උඩුනුවර ... | 25,000 | 0 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩිගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචිවී ඇති ග්‍රාම සංවර්ධන සමිති. කම්කරුසමිති සහ සමුපකාර සමිතිවලට සහ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට ද 73.07.27 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝරම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයන් විසින් මහනුවර කච්චේරියේ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිති ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම් තැපැල් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝරම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩරය බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝරම තැපෑලෙන් නොඑවන්නේ නම් ගාලු මුවදොර මහාලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 73.08.03 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේ ම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟවිය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව, ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු ය.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩය කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධව ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් පරිදි බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

7. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් පතක් මගින් මහනුවර දිසාපතිගෙන් ලබා ගත හැකිය.

ඩී.බී. ගුණරත්නායක,
මහනුවර දිසාපති වෙනුවට.

1973.06.25 දින,
මහනුවර දිසාපති කාර්යාලයේ දීය.

7–124—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

### හිස් තාර බැරල්, හිස් වානේ පීප්ප සහ හිස් සිමෙන්ති මළු මිළයට ගෙන ඉවත් කිරීම

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ ඌව දිසා කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන, ලාංකිකයන්ගෙන් හා ලාංකික ආයතනයන්ගෙන් පහත සඳහන් ද්‍රව්‍ය මිළයට ගෙන ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ :—

(1) හිස් තාර බැරල්
(2) හිස් වානේ පීප්ප
(3) හිස් සිමෙන්ති මළු

